# කටපාඩම් පද - 9 ශ්‍රේණිය

## බයිබල් පාඨ

1) "නුඹ මෙල්කිසදෙක්ගේ පරපුරෙන් සදහටම පූජකයෙක් ය" යි සමිඳාණෝ දිවුළ සේක" - **ගීතාවලිය** 110 :4

2) ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් දොළොස් දෙනා කැඳවා ඔවුන්ට බලය පවරා දුන් සේක" - **මතෙව්** 10:1

3) "මේ කුසලාන ඔබ උදෙසා වගුරුවනු ලබන මාගේ රුධිරයෙන් කළ නව ගිවිසුමය" - **ලූක්** 22:20

4) "ඔබ ගොස් සකල ජාතීන් ශ්‍රාවකයන් කරන්න; පියාණන්ගේද පුත්‍රයාණන් ගේද ශුද්ධාත්මයාණන් ගේද නාමයෙන් ඔවුන් බව්තිස්ම ස්නාපනය කරන්න" - **මතෙව්** 28:19

5) "මම මාගේ අණපණත් ඔවුන් තුළ පිහිටුවා එය ඔවුන්ගේ සිත්වල ලියන්නෙමි, මම ඔවුන්ගේ දෙවියන් වහන්සේ වන්නෙමි, ඔව්හු මාගේ සෙනඟ වන්නෝ ය" - **ජෙරමියා** 31:33

6) " නුඹලා මට පූජක රාජ්‍යයක්ද කැප වූ ජාතියක්ද වන්නහුය" - **නික්මයාම** 19:6

7) "ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පහළ වන සේක;පරමෝත්තමයාණන්ගේ ආනුභාවයද ඔබ වසාගන්නේය" - **ලූක්** 1:35

## අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය

8) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ, පෝන්සියුස් පිලාත් යටතේ, කුරුසියෙහි ඇණ ගසනු ලැබ, මරණයේ වේදනා විඳ, උකුත් වී තැන්පත් කරනු ලැබූ සේක - 4 **වගන්තිය**

9) ඔවුන්වහන්සේ පාතාලයට බැස, තුන්වෙනිදා මළවුන් කෙරෙන් උත්ථාන වී වදාළ සේක - 5 **වගන්තිය**

10) ශුද්ධ වූ කතෝලික සභාව කෙරෙහි ද විශ්වාස කරමි - 9 **වගන්තිය**